ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය


| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2013 ජූනි 26 වැනි දින |


**මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ප්‍රතිශතාංක 2 කින් පහළ දමන ලදී.**

දීර්ඝ කාලයක් පුරා බොහෝදුරට ස්ථායී මට්ටමක පවතින උද්ධමනයට ප්‍රතිචාර දක්වමින් 2012 දෙසැම්බර් මස සිට මුදල් මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික දෙවරක් පහළ දැමීම සහ ණය සඳහා වූ සීමාව ඉවත් කිරීම තුළින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රමිකව ලිහිල්කරන ලදී. මෙවැනි ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම හමුවේ සාමාන්‍ය ණය පොලී අනුපාතික පහළ ගියද එය තරමක් දුරට මන්දගාමීව සිදු විය. මේ අතරම, ශ්‍රී ලංකාවේ ඉතිරිකිරීම් හා ණය පොලී අනුපාතික අතර අන්තරය බොහෝ කලාපීය ආර්ථිකයන්ට වඩා තවමත් සැලකියයුතු අයුරින් ඉහළ අගයක පැවතීම පිළිබඳව මුදල් මණ්ඩලය සිය අවධානය යොමු කරන ලදී. මෙම තත්ත්වය, ශ්‍රී ලංකාවේ මූල්‍ය අතරමැදිකරණයෙහි කාර්යක්ෂමතාව සාපේක්ෂ වශයෙන් අඩුවීම පිළිබිඹු කළහැකි අතරම අනෙකුත් නැගී එන ආර්ථිකයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ඉහළ මට්ටමක පැවතීම ඒ සඳහා දායක වූ තවත් සාධකයක් ලෙස සැලකිල්ලටගෙන ඇත.

මේ අනුව, 2013 ජූනි මස 25 වැනි දින පැවති රැස්වීමේ දී, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අඩු කිරීම, බැංකු අංශයෙහි ණය පොලී අනුපාතික තවදුරටත් පහළ දැමීමට මෙන්ම පොලී අනුපාතික අන්තරය අඩු කිරීමට හැකියාව ලබාදෙනු ඇති බව මුදල් මණ්ඩලයෙහි මතය විය. මේ නිසා, වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් මත වන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 2013 ජූලි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිශතාංක 2 කින් සියයට 6 ක් දක්වා පහළ දැමීමට මුදල් මණ්ඩලය විසින්

තීරණය කරන ලද අතර එමගින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අනෙකුත් බොහෝ නැගී එන ආර්ථිකයන්හි මට්ටමට ගෙනඒමට හැකිවනු ඇත.

2012 දෙසැම්බර් මස සිට මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළට සංශෝධනය කිරීමත් සමගම දැනට සිදුකරන ලද ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අඩු කිරීම සහ බැංකු අංශයෙහි කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණුවීම තුළින් මෙම වසර සඳහා වන සාර්ව ආර්ථික පුරෝකථනයන්ට අනුකූලව පෞද්ගලික අංශය වෙත ලබාදෙන ණයෙහි වර්ධනය ඉහළ යාමට අවකාශ සලසමින් වෙළෙඳපොළ පොලී අනුපාතික සැලකියයුතු ලෙස පහළ වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.